# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1766/35 - 2012 ජූලි මස 13 වැනි සිකුරාදා - 2012.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2012 ජූලි මස 14 වැනි දින සිට ආරම්භ වන මාස 03 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2012 මැයි මස 11 වැනි දිනැති අංක 1757/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය, මගින් මාළු (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 හා 03.03), හාල්මැස්සන් (සංයෝජිත වර්ගීකරණ අංක 0305.59.20), කරවල (සංයෝජිත වර්ගීකරණ අංක 0305.59.90), අර්තාපල් (සංයෝජිත වර්ගීකරණ අංක 0701.90), බොම්බයි ළූනු (සංයෝජිත වර්ගීකරණ අංක 0703.10.20) සහ ටින් මාළු (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 16.04) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2012 ජූලි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 ජූලි මස 13 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 1. | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අලුත් හෝ ශීතකල මසුන් | කි.ග්‍රෑමයට 10% හෝ රු.10 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |

1A - G 16333 — 985 (2012/07)

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් | කි. ග්‍රෑමයට 10%හෝ රු. 10 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2. | 03.05 | 0305.59.20 | වියලූ ලුණු නොදැමූ හාල්මැස්සන් | කි.ග්‍රෑමයට රු.10 |
| 3. | | 0305.59.90 | අනෙකුත් - කරවල | කි.ග්‍රෑමයට රු.75 |
| 4. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි.ග්‍රෑමයට රු.10 |
| 5. | 07.03 | 0703.10.20 | බොම්බයි ළූනු | කි.ග්‍රෑමයට රු.25 |
| 6. | 16.04 | 1604.11 | සැමන් | කි.ග්‍රෑමයට රු.50 |
| | | 1604.12 | හුරුල්ලන් | කි.ග්‍රෑමයට රු.50 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හැල්මැස්සන් | කි.ග්‍රෑමයට රු.50 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටෝ (සර්ඩා විශේෂයේ) | කි.ග්‍රෑමයට රු.50 |
| | | 1604.15 | මැකරල් | කි.ග්‍රෑමයට රු.50 |
| | | 1604.16 | ඇන්චෝවිසි | කි.ග්‍රෑමයට රු.50 |
| | | 1604.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.50 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාලු | කි.ග්‍රෑමයට රු.50 |

08 - 105

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.